# මාලිනී රණසිංහයන්ට බ්‍රිස්බේන් නුවරින් උපහාර



**උදය මඩුගල්ලේ**
බ්‍රිස්බේන්

"ප්‍රේමවන්ත දරුවෙනි මා
හිඳිනු කන් යොමා
කියමි පුවත සැක දුරැරා
අසන නිතියෙනා....."

මෙසේ සිංහල වේදිකාවේ දිග හැරුණු මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍යයේ සුප්පා දේවියගේ චරිතය පුරා වසර 32ක් එක දිගට රඟපාමින් ශ්‍රී ලාංකික නාට්‍ය කලාවට මාලිනී රණසිංහ කල සේවය වෙනුවෙන් ඇයට උපහාර දැක්වීමේ උලෙලක් පසුගිය මැයි මස 25 වැනිදා බ්‍රිස්බේන් නගරයේදී පැවැත්වුණි.

බ්‍රිස්බේන් 4EB ප්‍රජා ගුවන් විදුලියේ ශ්‍රී ලාංකික කණ්ඩායම සංවිධානය කල මෙම උපහාර උලෙලට නාට්‍යයක් නැරඹීමට කිසිදිනෙක එක් රොක් නොවූ තරම් විශාල රසික රසිකාවියන් පිරිසක් සහභාගි වූහ.

මාලිනී රණසිංහ සිංහල වේදිකාවට එක්වී දැක්වූ රංගන කුසලතා නිසාවෙන් 1987 දී රාජ්‍ය නාට්‍ය උලෙලේ සහ එම වසරේ සාම නාට්‍ය උලෙලේ දී හොඳම සහය නිළිය සඳහා වූ සම්මානයට පාත්‍ර වීමටත් ඇය භාග්‍ය ලැබුවාය.

ඉන් අනතුරුව තම දිවි ගමනේ සහකරු වූ ටෙරන්ස් රණසිංහ මහතා සමඟ සිංහබාහු නාට්‍යයේ අඛණ්ඩ දර්ශන වාර 5000ක රඟපෑමෙන් ගිනස් වාර්තා පොතට ඇතුලු වෙමින් ලෝක වාර්තාවක් තැබීමටද ඇය සමත් වූවාය.

මාලිනී රණසිංහ තම දිගු රංගන දිවියේදී වේදිකා නාට්‍ය 7කත්, චිත්‍රපට තුනකත්, ටෙලිනාට්‍ය නවයකත් රඟපා තම දක්ෂතාවයන් ප්‍රකට කලාය.

මෙම උපහාර උලෙලට සහභාගි වූ ප්‍රවීන රංග ශිල්පී ආචාර්ය ජයලත් මනෝරත්න, මාලිනී රණසිංහගේ රංගන දිවිය පිළිබඳ අදහස් දක්වමින් කියා සිටියේ ඇය ප්‍රධාන අභියෝග හතරක් ජයගනිමින් තම රංගන හැකියාවන් තම දිවියේ අඩකටත් වැඩි කාලයක් තිස්සේ ඉතා දක්ෂ ලෙස විදහාලූ බවය.

සිංහල ගැමි නාට්‍ය කලාවේ අංගවූ කිඳුරු, සොකරි, කෝලං, පාස්කු, නාඩගම් ආදියෙහි කාන්තා චරිත සඳහා කාන්තාවන්ට සහභාගි වීමට අවස්ථාවක් නොදුන් බවත් ඒ වෙනුවට පිරිමින් කාන්තා චරිත රඟ පෑ බවත් ඔහු පැවසීය. මෙසේ කාන්තා චරිත සඳහා කාන්තාවන්ට ඉදිරිපත් වීමට ඉඩකඩ නොතිබූ යුගයක පළමුවරට ස්ත්‍රී චරිතයක් රඟපෑවේ ආනා පෙරේරා (පසුව ආනා කන්නන්ගර) 1885 සැප්තැම්බර් 26 දින බව මතක් කල මනෝරත්නයන් ඉන් අනතුරුව වේදිකා රංගනයට එක්වූ රුක්මනී දේවී ඇතුලු විවිධ රංගන ශිල්පිනියන්ට විවිධ සමාජමය සහ පවුල්මය අභියෝගවලට මුහුණ දීමට සිදුවූ බවද කීය. එලෙසින්ම මාලිනී රණසිංහයන්ටත් විවිධ සමාජමය හා පවුල්මය අභියෝගවලට මුහුණදීමට සිදුවුවත් ඇය එම බාධක, වැටකඩොලු පැන යමින් ඉතා සාර්ථක ලෙස නාට්‍ය කලාවට එක්වූ බව පැවසීය.

1961 දී මාලිනී රණසිංහ විද්‍යා විෂයන් හැදෑරීමට විශ්ව විද්‍යාලයට ඇතුලු වුවද ජාතියේත්, නාට්‍ය කලාවේත් භාග්‍යයක් නිසා මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නාට්‍යයට එක්වීමට ඇයට වරම් ලැබුනාය.

ඇය ජයගත් පලමු අභියෝගය වන්නේ විද්‍යා විෂයන් හදාරමින් රංගන කලාවේ දිගු ගමනක් යාමට පියවර තබමින් හා ඉන්පසු දිගින් දිගටම නාට්‍ය පුහුණුවීම් මැද්දේ තම විද්‍යා උපාධිය සාර්ථකව නිම කිරීමයි.

මාලිනී රණසිංහ ජයගත් දෙවැනි අභියෝගය වන්නේ රංග ධාරිණියක් ලෙස රංග ශෛලීන් තුනක නාට්‍යය තුනකට එකම කාලවකවානුවකදී දායකවීමයි. ඒ සඳහා ඇය තුල වූ දක්ෂතාවය අති මහත්ය. මෙම රංග ශෛලීන් තුනක නාට්‍යවන්නේ සිංහබාහු, වෙස්සන්තර හා මායා දේවිය. සිංහබාහු යනු නාඩගම් නාට්‍ය සම්ප්‍රදායේ ගීතමය නාට්‍යයක් වන අතර වෙස්සන්තර යනු ගීත සහ සංවාද සහිත ගීතාංග නාට්‍යයකි. මායාදේවී යනු පූර්ව ස්වතන්ත්‍ර තාත්වික නාට්‍යයකි. එකම වකවානුවක මෙසේ ශෛලීන් තුනක නාට්‍ය තුනක රඟපෑම මහත් අභියෝගයක් වුවද ඇය ඉතා දක්ෂ ලෙස එම අභියෝගය ජයගත්තාය.

ඉන් අනතුරුව ඇය සිනමාවට සම්බන්ධ වෙමින් අනෝමා හිමගිර සහ යක්ෂාවේශය චිත්‍රපටවල රඟපෑවාය. ඉන්පසු රූපවාහිනී ටෙලි නාට්‍යවලට සම්බන්ධවී සෙක්කු ගෙදර, මවකගේ ගීතය, අඹ යහලුවෝ, ටිකිරි නිලමේ ආදියෙහි ප්‍රබල චරිත රඟපෑවාය. ශ්‍රී ලාංකික ජන සමාජයේ අතිමහත් දුෂ්කරතාවලට මුහුණ දෙන, තැලෙන, පෑගෙන ස්ත්‍රී භූමිකාවන් මෙම චරිතවලින් නිරූපනය වූ අතර මාලිනී රණසිංහ එම චරිතවලට දක්ෂ ලෙස පණ පෙව්වාය.  ඇය ජයගත් තෙවැනි අභියෝගය වන්නේ පරිමාණ තුනක වූ මාධ්‍ය තුනක රඟපෑමේදී මුහුණදීමට සිදුවන බාධක මැඩගෙන රඟපෑමයි. ජීවිතයට වඩා විශාල වූ සිනමාවේත්, ජීවිතයට වඩා කුඩා වූ රූපවාහිනී තිරයේත්, ජීවිතය හා සමාන වූ ප්‍රේක්ෂකයා සමඟ මුහුණට මුහුණලා හමුවන වේදිකාවේත් යන මාධ්‍ය තුනෙහිම විවිධ භූමිකාවන් විශිෂ්ඨ අන්දමින් රඟ දක්වන්නට ඇය සමත් වූවාය. මේ සඳහා ඇය කැපකල කාලයක අප්‍රමාණය. එමෙන්ම කැපකල නිර්මාණ වේශය අප්‍රමාණය. තමාගේ පවුල් ජීවිතය, සමාජ ජීවිතය මෙන්ම පාසැලේ උගන්වන ජීවිතයද බාධා නොවන අයුරින් ඒ හැම එකක් සඳහාම තම ශ්‍රමය සහ කාලය කැපකරන අතර තුර රඟපෑමටද ඇය සමත් වූවාය.

මෙසේ බොහෝ කාලයක් තිස්සේ විවිධ ශෛලීන්වලට අයත් වේදිකා නාට්‍ය, ටෙලි නාට්‍යය මෙන්ම චිත්‍රපටවලද විවිධ චරිතවලට පණ පෙවූ නමුදු සිංහබාහු නාට්‍යයේ සුප්පා දේවීගේ චරිතයට නොකඩවා අවුරුදු 32ක් දර්ශන වාර් 5000කට සහභාගිවීමට ඇය ජයගත්තාවූ හතරවන අභියෝගයයි.

විශේෂයෙන්ම කාන්තාවන් ලෙස ශ්‍රී ලාංකික ජන සමාජයෙන් සහ ගෘහ ජීවිතයෙන් පැමිණි සියලු බාධක ජයගනිමින් එමෙන් ඇගනේ ඉටුවිය යුතු යුතුකම් නොපිරිහෙලා ඉටුකරමින් සහ රසික හදවත්හි සදාතනිකවම ජීවත් වෙමින් විශිෂ්ඨ රංගනයක දිගු කලක් නියැලීම ඇය සතු අභියෝග ජයගැනීමේ කුසලතාව මනා පෙන්නුම් කරයි.

1961 දී වේදිකා ගතවූ සිංහබාහු සහ නරිබෑනා යන නාට්‍ය මේ වනවිට අවුරුදු 60කට වඩා ශ්‍රී ලංකාවේදී  වේදිකාගත වී ඇති අතර ඇගතා ක්‍රිස්ටිගේ "මවුස් ට්‍රැප්" නාට්‍ය වසර පනහකට වඩා එන්ගලන්තයේ වේදිකාගත වී ඇති නමුත් මාලිනී රණසිංහ හැර වෙනත් කිසිම නාට්‍ය ශිල්පියෙක් හෝ ශිල්පිනියක් මේ තරම් දිගු කාලයක් දර්ශන වාර 5000කට වඩා සහභාගි වී නොමැත. ඇය ගිනස් වාර්තා පොතට ඇතුලු වී ඇත්තේ එබැවිනි.



මෙසේ දීර්ඝ කාලයක් රඟපෑමේ කුසලතාවයන් ප්‍රගුණ කල මාලිනී රණසිංහ තම රඟපෑමේ හැකියාව ඉදිරි පරම්පරාව වෙත ගෙන යමින් පළමුවෙන්ම තම දියණිය කාංචනමාලා සහ ඇයගේ සමකාලීන දරු දැරියන්ටත් ඉන් අනතුරුව තම මිණිබිරිය වන අරවින්දි ගුණවර්ධන ඇතුලු බ්‍රිස්බේන්හි වසන අනිකුත් දරුදැරියන්ටත් දායක කරන්නට දැක්වූ සහ දක්වන කැපවීම සහ ධෛර්යය අගය කල යුතුය.

බ්‍රිස්බේන් නුවර වසන ශ්‍රී ලාංකික නාට්‍ය රසික රසිකාවියන් එක්වී මෙම අද්විතීය නාට්‍ය රංග ශිල්පිනියට දැක්වූ උපහාරය පිළිබඳව අනිකුත් නාට්‍ය ශිල්ප ශිල්පීන් වෙනුවෙන් ස්තූතිය පලකල ජයලත් මනෝරත්නයන් ගිනස් වාර්තාව තබා ශ්‍රී ලංකාවට පැමිණි දිනයේ මාලිනී රණසිංහ සහ ටෙරන්ස් රණසිංහ දෙපලට ශ්‍රී ලංකා රජය විසින් සම්මානය පිරි නමන අවස්ථාවේ දැක්වූ හේතු පාදකයන් මෙසේ ගෙනහැර දැක්වීය.
"ප්‍රභාෂ්වර නව ලෝකයක උරුම හිමිකම් සොයා ගිය පරපුරක පුරෝගාමී පුත්‍රයෙකුට හා දියණියකට මවක වෙමින්ද, ප්‍රේමය නම් රසාංජාලයෙන් නෙත් අඳුන් දුන් අභීත පීතෘත්වයට පියඹකු වෙමින්ද ඇය දශක තුනක් පුරා පන්දහස් වාරයකට අධිකව මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ සිංහබාහු නම් අභිරංගයේ සුප්පාදේවී නම් මාතෘ භූමිකාවට සමාරෝපිත වී සිටියාය. එකී සම්භාව්‍ය අභිරංගනයේ පොතේ ගුරු භූමිකාවට පණ පොවමින් ගාම්භීරතාපූර්ණ කට හඬින් සුවහසක් ප්‍රේක්ෂක දනන්හට හද බඳිමින් හෙතෙමේ මේ සා කාලයක් මුලුල්ලේ අඛංඩව රැඟුම්දීද දිවියේදීද ඇය හා එක්ව සිටියාය.

1960 දශකයේදී විද්‍යාර්ථීන් ලෙස පේරාදෙණිය සරසවිය නම් වූ මහා ඥාන කලා පෝෂිතාගාරයට පිවිස මහදුරු සරච්චන්ද්‍රයන් නම් වූ යුග කාරක පුරුෂයානන්ගෙන් විවරණ ලැබ ඔහුගේ සෙවනේ හික්මෙමින් ඇරඹූ දිගු ගමන එතුමාගේ තවත් ද් කලා ව්‍යාපාරයන්ට දායක වෙමින්ම අද දවසේ පන් දහස් වාරයක් ඉක්මවා ගිය ලෝකයේ දීර්ඝතම රංගන භූමිකාව බිහිකොට ඇත්තේය. දශක තුනක් මුලුල්ලේ සිය ප්‍රතිභාන්විත රංගන කෞෂල්‍යයෙන් බිඳකදු අඩු නොකොට ජාතිකත්වය අභිභවනය කොට විශ්ව රංග භූමියේ ගෞරව බහුමානයට පාත්‍ර වූ මේ රංග වේදී පති - පත්නිය වූ ටෙරන්ස් රණසිංහ

42 පිටට

## Design and Drafting Service

We are here to support and advise you  throughout every stage of your project.

We provide Building design and Drafting services for

- New Homes, Extensions, Units, Garages, & Carports to obtain relevant permits.
- Domestic & industrial Structural Steel Structures & Estimations
- 3D Architectural visualization and walkthrough

Specialized in Design, Detailing, Fabrication & Erection of Steel Structures.

Call us for further details or to arrange a site inspection.

Don 0488508771
Jayantha 0425885178
Email: don.heli1@gmail.com
(preferably week days after 4pm & anytime on week end)

REGISTERED
Building Practitioner